මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk
ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2021 නොවැම්බර් මස 25 දින |

## මුදල් ප්‍රතිපත්ති විවරණය: අංක 08-2021 නොවැම්බර්

# ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතික දැනට පවතින මට්ටමේ පවත්වාගනී

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය 2021 නොවැම්බර් මස 24 වැනි දින පැවති රැස්වීමේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), පිළිවෙළින්, සියයට 5.00 සහ සියයට 6.00 ලෙස දැනට පවතින මට්ටමේ පවත්වාගෙන යෑමට තීරණය කළේය. දේශීය සහ ගෝලීය වශයෙන් වන සාර්ව ආර්ථික තත්ත්වයන් සහ අපේක්ෂිත වර්ධනයන් මනාව සලකා බැලීමෙන් අනතුරුව මුදල් මණ්ඩලය මෙම තීරණයට එළඹුණි. ප්‍රධාන වශයෙන් සැපයුම් අවහිරතා සහ ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ඉහළ යෑම හේතුවෙන් මෑතකාලීනව උද්ධමනය ඉහළ යෑම මුදල් මණ්ඩලය නිරීක්ෂණය කළ අතර, ඉදිරි කාලය තුළදී ආර්ථිකයට එහි විභව මට්ටම කරා ළඟාවීම සඳහා සහාය වන අතරම, සුදුසු ක්‍රියාමාර්ග මගින් මැදි කාලීනව උද්ධමනය ඉලක්කගත මට්ටමේ පවත්වා ගැනීම සඳහා වන සිය කැපවීම මුදල් මණ්ඩලය නැවත අවධාරණය කරන ලදී.

## ශ්‍රී ලංකාවේ ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වෙමින් පවතී

රාජ්‍ය මූල්‍ය සහ මුදල් උත්තේජක ක්‍රියාමාර්ගවල සහායයෙන් ශ්‍රී ලංකා ආර්ථිකය 2021 වසරේ පළමු භාගය තුළදී වේගයෙන් යථා තත්ත්වයට පත් වීමක් පෙන්නුම් කළේය. කොවිඩ්-19 වසංගතය නැවත ව්‍යාප්ත වීම සහ එහි බලපෑමෙන් නිෂ්පාදන කටයුතුවලට ඇතිවූ අවහිරතා හේතුවෙන් 2021 වසරේ තුන්වන කාර්තුවේදී දැනට පවතින ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් වීම සඳහා තරමක්දුරට බලපා ඇති බව පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, සාපේක්ෂව ඉක්මනින් යාවත්කාලීනවන දර්ශක මගින් පෙන්නුම් කරන පරිදි ආර්ථික ක්‍රියාකාරකම් වේගයෙන් යථා තත්ත්වයට පත්වෙමින් පවතී. 2021 ඔක්තෝබර් මාසයේදී කොවිඩ්-19 ආශ්‍රිත සංචරණ සීමා ඉවත් කිරීම සහ රටපුරා සාර්ථකව කොවිඩ්-19 එන්නත්කරණය ක්‍රියාත්මක කිරීම ඉදිරි කාලසීමාව තුළ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා උපකාරී වනු ඇත. මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 2021 වසර තුළදී සියයට 5කින් පමණ වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, ගෝලීය සහ දේශීය වශයෙන් කොවිඩ්-19 ආසාදිතයන්ගේ අඛණ්ඩ වැඩිවීම මෙම අපේක්ෂාවට යම් දුරකට බලපෑම් ඇති කරනු ඇත.

## දැඩි අභියෝග මධ්‍යයේ විදේශීය අංශය ශක්තිමත්ව පවතී

වෙළඳ භාණ්ඩ අපනයන ආදායම 2021 වසරේ සැප්තැම්බර් මාසයේදී අඛණ්ඩව සිව්වන වරටත් එ.ජ. ඩොලර් බිලියන 1 ඉක්මවා වාර්තා කරමින් ශක්තිමත් ලෙස පැවතුණි. වෙළඳ භාණ්ඩ අපනයන මෙතෙක් වාර්තා කර ඇති ඉහළම අගය 2021 වසරේ ඔක්තෝබර් මාසයේදී වාර්තා කර ඇති බව මූලික දත්ත මගින් පෙන්නුම් කරයි. ආනයන වියදම්ද ඉහළ ගිය අතර, 2021 වසරේ

සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ වෙළඳ හිඟය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පුළුල් විය. සංචරණ සීමා ලිහිල් කිරීමත් සමඟ සංචාරක අංශය සැලකිය යුතු ලෙස යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කෙරේ. මෑත මාසවල විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් අඩු වුවද, ශ්‍රම සංක්‍රමණය අඛණ්ඩව ඉහළ යෑම සහ විධිමත් මාර්ග හරහා ප්‍රේෂණ ප්‍රවාහවලට පහසුකම් සැලසීමට ගන්නා ප්‍රයත්න හේතුවෙන් ඉදිරි කාලය තුළ එහි යථා තත්ත්වයට පත් වීමක් අපේක්ෂා කෙරේ. 2021 වසරේ මේ දක්වා කාලය තුළ එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම සියයට 7.2ක් ලෙස වාර්තා වේ. පසුගිය මාස තුන තුළ විනිමය අනුපාතිකය එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල් 200-203 අතර මට්ටම්වල ස්ථාවරව පැවතුණි. මේ අතර, 2021 වසරේ ඔක්තෝබර් මස අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 2.3ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. කෙසේ වෙතත්, මෙම සංචිත ප්‍රමාණය තුළ චීන මහජන බැංකුව සමඟ ඇති කරගත් චීන යුවාන් බිලියන 10ක (ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 1.5කට සමාන) ද්විපාර්ශ්වික මුදල් හුවමාරු පහසුකම ඇතුළත් නොවේ. තවද, නව විදේශ විනිමය ලැබීම් ආකර්ෂණය කර ගැනීම සඳහා රජය සහ මහ බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග මෙන්ම මූල්‍ය අංශය ඇතුළු පෞද්ගලික අංශය වෙත අපේක්ෂිත ලැබීම් මගින් දළ නිල සංචිත ප්‍රමාණය ඉහළ නැංවෙනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින් ඉදිරි කාලය තුළ විදේශීය අංශය ශක්තිමත් වනු ඇත. විශේෂයෙන්ම, අපනයන ආදායම් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය වීමේ සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබෙන අතර, සය මාසික පෙර දැක්මෙහි අපේක්ෂිත ඉලක්කයන්ට අනුකූලව රජය සහ මහ බැංකුව විදේශීය පාර්ශ්වයන් සමඟ සාකච්ඡා අඛණ්ඩව සිදු කරමින් පවතී.

## දැඩි මුදල් තත්ත්ව වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම පිළිබිඹු කරමින් වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ ගොස් ඇත

දැඩි මුදල් සහ ද්‍රවශීලතා තත්ත්වයන්ට ප්‍රතිචාර දක්වමින් බොහෝ වෙළඳපොළ ණය පොලී අනුපාතික ඉහළ ගොස් ඇත. සැලකිය යුතු ලෙස ඉහළ ගිය රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික, වර්ධනය වූ වෙළඳපොළ තත්ත්ව පිළිබිඹු කරමින් ප්‍රාථමික වෙන්දේසිවල වැඩි දියුණු වූ දායකත්වයන් සමඟ ස්ථාවර වී ඇත. මේ අතර, ලිහිල් මුදල් තත්ත්ව යටතේ සැලකිය යුතු ලෙස ඉහළ ගිය පෞද්ගලික අංශයට ලබා දුන් ණය වර්ධනය, 2021 සැප්තැම්බර් මාසයේදී තරමක් අඩු වී ඇත. කෙසේ වෙතත්, ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම සඳහා සහාය සපයමින් විශේෂයෙන්ම ආර්ථිකයේ කර්මාන්ත සහ සේවා අංශ වෙත ණය ප්‍රවාහයන් සැලකිය යුතු ලෙස වැඩිදියුණු වී ඇති බව 2021 සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවයක කාලය සඳහා වන දත්ත මගින් පෙන්නුම් කරයි. මේ අතර, රාජ්‍ය අංශය විසින් බැංකු පද්ධතියෙන් ලබාගත් ණය ද, විශේෂයෙන්ම රජයට ලබා දුන් ශුද්ධ ණය අඛණ්ඩව ඉහළ ගියේය. සමස්තයක් වශයෙන්, පෞද්ගලික අංශයට ලබා දුන් ණය ප්‍රසාරණය අඩු වීම සහ බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම්වල අඩු වීමට අනුරූපව, 2021 සැප්තැම්බර් මාසයේදී පුළුල් මුදල් වර්ධනය ($M_{2b}$) මන්දගාමී විය.

## ප්‍රධාන වශයෙන් සැපයුම් අංශයේ අවහිරතා සහ ජාත්‍යන්තර වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් උද්ධමනය මෑත කාලීනව ඉහළ ගියේය

ආර්ථිකයේ සමස්ත ඉල්ලුම් තත්ත්ව ක්‍රමයෙන් ඉහළ යෑම මෙන්ම සැපයුම් අංශයේ අවහිරතා, දේශීය මිල පාලන ඉවත් කිරීම සහ ඉහළ යන ගෝලීය බලශක්ති හා අනෙකුත් වෙළඳ භාණ්ඩ මිල ගණන් වල බලපෑම පිළිඹිබු කරමින් පරිපාලිත මිල ගණන් කිහිපයක සිදු වූ ඉහළ යෑම් හේතුවෙන් උද්ධමනය මෑත කාලීනව ඉලක්කගත මට්ටමට වඩා ඉහළ ගොස් ඇත. නුදුරු

අනාගතයේදී මතුපිට උද්ධමනය තවදුරටත් ඉහළ යෑමේ හැකියාවක් පැවතුණද එවැනි විචලනයන් තාවකාලික වනු ඇතැයි අපේක්ෂා කරයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැනට ගෙන ඇති මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග, අධික ඉල්ලුම් පීඩන සමනය කිරීමට සහ අහිතකර උද්ධමන අපේක්ෂා ඇතිවීම වැළැක්වීමට උපකාරී වනු ඇත.

## ප්‍රතිපත්ති පොලී අනුපාතික දැනට පවතින මට්ටමේ පවත්වා ගැනෙයි

ඉහත සඳහන් කළ පරිදි පවත්නා සහ අපේක්ෂිත සාර්ව ආර්ථික ප්‍රවණතා සැලකිල්ලට ගනිමින්, දැනට පවත්නා ප්‍රතිපත්ති පොලී අනුපාතික යෝග්‍ය බව මුදල් මණ්ඩලයේ අදහස විය. මහ බැංකුව විසින් දේශීය හා ගෝලීය සාර්ව ආර්ථික සහ මූල්‍ය වෙළඳපොළ ප්‍රවණතා පිළිබඳ සුපරීක්ෂාකාරී වෙමින් ඒවා අඛණ්ඩව නිරීක්ෂණය කරනු ඇති අතර විදේශීය අංශයේ ස්ථායී බව සහතික කරමින්, අපේක්ෂිත පරාසයෙහි උද්ධමනය පවත්වා ගනිමින් සහ ආර්ථිකය තිරසාර ලෙස යථා තත්ත්වයට පත්වීමට සහාය වීම යන අරමුණ ඇතිව අවශ්‍ය අවස්ථාවන්හිදී සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇත.

**මුදල් ප්‍රතිපත්ති තීරණය : ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය නොවෙනස්ව පවතී**

| | |
|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | සියයට 5.00 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | සියයට 6.00 |
| බැංකු අනුපාතිකය | සියයට 9.00 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | සියයට 4.00 |

**තොරතුරු සටහන:**

මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතාගේ ප්‍රධානත්වයෙන් 2021 නොවැම්බර් මස 25 වැනි දින පෙ.ව. 11.00ට ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්ථාගාරයේදී මාධ්‍ය හමුවක් පැවැත්වෙන අතර එය ෆේස්බුක් සහ යූ ටියුබ් ඔස්සේ සජීවීව විකාශය කෙරේ.

2022 වසර සඳහා වන පළමු මුදල් ප්‍රතිපත්ති නිවේදනය නිකුත් කරන දිනය ඉදිරියේදී ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

**ඇමුණුම 1**

## සංඛ්‍යා සටහන 01: උද්ධමනය

| මාසය | | මාර් 21 | අප්‍රේ 21 | මැයි 21 | ජූනි 21 | ජූලි 21 | අගෝ 21 | සැප් 21 | ඔක් 21 |
|---|---|---|---|---|---|---|---|---|---|
| මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස) | කො.පා.මි.ද. (2013=100) | 4.1 | 3.9 | 4.5 | 5.2 | 5.7 | 6.0 | 5.7 | 7.6 |
| | ජා.පා.මි.ද. (2013=100) | 5.1 | 5.5 | 6.1 | 6.1 | 6.8 | 6.7 | 6.2 | 8.3 |
| මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස) | කො.පා.මි.ද. (2013=100) | 3.1 | 3.0 | 3.2 | 3.2 | 3.7 | 4.1 | 5.0 | 6.3 |
| | ජා.පා.මි.ද. (2013=100) | 4.3 | 4.1 | 4.2 | 4.1 | 4.4 | 4.7 | 4.8 | 7.2 |

*මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

## සංඛ්‍යා සටහන 02: මුදල් අංශයේ ප්‍රවණතා (තාවකාලික)

| දර්ශකය | ප්‍රමාණය (රුපියල් බිලියන) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ජන 21 | පෙබ 21 | මාර් 21 | අප්‍රේ 21 | මැයි 21 | ජූනි 21 | ජූලි 21 | අගෝ 21 | සැප් 21 |
| සංචිත මුදල් | 976 | 978 | 1,029 | 1,031 | 1,036 | 1,065 | 1,064 | 1,089 | 1,296 |
| පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 9,533 | 9,651 | 9,839 | 9,947 | 10,033 | 10,165 | 10,304 | 10,514 | 10,488 |
| ශුද්ධ විදේශීය වත්කම් | (321) | (386) | (430) | (431) | (429) | (481) | (699) | (701) | (722) |
| ශුද්ධ දේශීය වත්කම් | 9,854 | 10,037 | 10,269 | 10,378 | 10,462 | 10,646 | 11,003 | 11,215 | 11,210 |
| රජය වෙත ලබා දුන් ශුද්ධ ණය | 4,758 | 4,793 | 5,005 | 4,965 | 5,024 | 5,195 | 5,513 | 5,682 | 5,792 |
| රාජ්‍ය සංස්ථා සඳහා ලබා දුන් ණය | 1,058 | 1,080 | 1,098 | 1,093 | 1,113 | 1,132 | 1,141 | 1,137 | 1,123 |
| පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය | 6,197 | 6,276 | 6,388 | 6,446 | 6,501 | 6,585 | 6,661 | 6,796 | 6,825 |
| පුළුල් මුදල් සැපයුම ($M_4$) | 11,643 | 11,790 | 12,010 | 12,154 | 12,265 | 12,402 | 12,563 | 12,790 | 12,742 |

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

## සංඛ්‍යා සටහන 03: පොලී අනුපාතික

| පොලී අනුපාතික (%) | 2021 මැයි අවසානයට | 2021 ජූනි අවසානයට | 2021 ජූලි අවසානයට | 2021 අගෝ අවසානයට | 2021 සැප් අවසානයට | 2021 ඔක් අවසානයට | 2021 නොවැ 24 දිනට |
|---|---|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 4.50 | 4.50 | 4.50 | 5.00 | 5.00 | 5.00 | 5.00 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 5.50 | 5.50 | 5.50 | 6.00 | 6.00 | 6.00 | 6.00 |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR)** | 4.66 | 4.93 | 5.10 | 5.79 | 5.94 | 5.93 | 5.92 |
| **භාණ්ඩාගාර බිල්පත් එලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | | | | | |
| දින 91 | 5.13 | 5.18 | 5.22 | 5.87 | 6.70 | 8.43 | 7.53 |
| දින 182 | 5.14 | 5.19 | 5.23 | 5.90 | 6.99 | 8.16 | 8.02 |
| දින 364 | 5.18 | 5.23 | 5.25 | 5.93 | 7.01 | 8.18 | 8.16 |
| **ණය අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (AWPR) (සතිපතා) | 5.65 | 5.51 | 5.76 | 6.01 | 6.42 | 7.82 | 8.03 (අ) |
| බරිත සාමාන්‍ය ණය අනුපාතිකය (AWLR) | 9.64 | 9.50 | 9.45 | 9.38 | 9.37 | - | - |
| බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය (AWNLR) | 7.74 | 7.47 | 8.09 | 8.04 | 8.14 | - | - |
| **තැන්පතු අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 4.97 | 4.87 | 4.77 | 4.75 | 4.75 | 4.79 | - |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 5.94 | 5.82 | 5.67 | 5.62 | 5.64 | 5.70 | - |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 4.77 | 4.98 | 4.99 | 5.19 | 5.53 | - | - |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 4.90 | 5.10 | 5.15 | 5.35 | 5.69 | - | - |

(අ) 2021 වසරේ නොවැම්බර් මස 19 වන දිනෙන් අවසන් වන සතිය සඳහා

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*